

# කැලේ රජා වෙනස් වෙලා

බොහෝ ම ඉස්සර එක්තරා දූපතක් වනයෙන් වැසී තිබිණි. එ ම වනයේ අලි, ගෝන, වලස්, සිංහ, මුව, මුගටි ආදී සත්තු ද නයි, පොළොං ආදී විෂඝෝර සත්තු ද කුරුමිණි, කැරපොතු හා කුහුඹි වැනි කුඩා සත්තු ද රාශියක් විසූ හ.

එක් දිනෙක දී මේ සත්තු කැලෑ සංගමයක් පිහිටුවා ගත් හ. ඒ සංගමයේ ලොකු පුංචි භේදයක් තිබුණේ නැත. සැම දෙනා ම සමාන ව සලකනු ලැබූ හ.



නිහතමානී, කාර්ය ශූර, කල්පනාවෙන් වැඩ කරන වලසෙක් එහි සභාපති විය. ලේකම් වූයේ ගිරවෙකි. භාණ්ඩාගාරිකකම කොටියකුට භාර විය. අනික් සාමාජිකයෝ නම් ගෝනෙක්, කුරුමිණියෙක්, පොලහෙක් හා මාළුවෙකි. සෑම වර්ගයෙකින් ම සංගමයේ සාමාජිකයෝ සමන්විත වූ හ.

මේ සංගමය ඔවුනොවුන් ගේ අඩුපාඩු හා දියුණුව ගැන සෑම විට කටයුතු කරන්නට විය.

එක් දිනෙක දී සංගමයේ සාමාජිකයෝ ''අප ගේ කැලෑවේ හොඳ නායකයෙක් නැතිනම් රජෙක් සිටී නම් අප කාටත් හොඳ අනාගතයක් ඇති විය හැකි යි'' යෝජනා කරන්නට වූ හ.

"ඔව්, ඔව්, ඒක නම් හොඳ අදහස, රජෙක් නම් වඩා හොඳ යි" කුකුළෙක් එය අනුමත කෙළේ ය.

"රජා සොයන එක ඒ තරම් ලෙහෙසි වෙන එකක් නෑ. සාමාජිකයනට ඉදිරිපත් වන්න කියමු.

"මේ සඳහා ඉදිරිපත් වන අය ගෙන් අදහස් විමසා බලා වඩා හොඳ කෙනා රජා කරමු" සංගමයේ සභාපති යෝජනා කෙළෙන් සැවොම එයට කැමැති වූ හ.

පළමු වැනි අපේක්ෂකයා අලියා, "මම මේ රජකමට වඩා ම සුදුසු ය යි කියා ඔබ සියලු දෙනා ම හිතනවා ඇති. මගේ ඇඟේ හැටියට ඕනෑ ම කෙනකු මෙල්ල කරන්න කිසි කරදරයක් නෑ. මම තමයි රජකමට ඉතා සුදුසු."





දෙවැනියා වූයේ, නරියෙකි. "ඔබ කවුරුනුත් දන්නවා අපේ වර්ගයේ හැටි. හොඳ කට්ට වෙට්ට පිත්තල උදවිය නේ? ඕනෑ ම බැරෑරුම් ප්‍රශ්නයක් ඉතා සූක්ෂම ලෙස විසඳන්න පුළුවන් නරියකුට ම පමණ යි, එහෙම කෙනකු රජ කරවන එක ඔය අයටත් නම්බුවක්."

තුන් වැන්නා මොනරෙකි. "රජකු වුණා ම ප්‍රියමනාප ආකාරයට කාටත් පෙනෙන්න ඕනෑ. කැත නැති ව අප ගේ රජා කියා පෙන්වන්න, බලන්න පිල් විහිදු සිටින විට, මා රජකමට සුදුසු නැහැ යි කවුරු කියත් ද?"

හතර වැන්නා වූයේ මහා නාගයෙකි. "පෙර රජ දවස සිට අප වැනි අයට කීවේ මහා නාග රාජයා කියා. නමින් ම පෙනෙනවා නේ ද? අපේ රාජවංශය, ඕනෑ ම කෙනකුට දෂ්ට කිරීමෙන් සිහි නැති කොට මෙල්ල කරන්න මට

ශක්තිය තියෙනවා. රජකමට මට වඩා හොඳ කෙනෙක් නෑ."

පස් වැන්නා වූයේ තල්මසෙකි. "ඔබ හැම ගොඩ-ජලය කියා බේදයක් නැති ව වැඩ කටයුතු කරන උදවිය. මුහුදේ සිටිය ද ඔබ හැමගේ දුක සැප හොඳින් මට හොයා බලන්න පුළුවන්. ඕනෑ ම කෙනකු මෙල්ල කරන්න බැරි වුවහොත් මට ඔහු ගිලදන්න වුණත් පුළුවන්".

ස-වැන්නා වූයේ කුකුළෙකි. "ඔබ දන්නවානේ, එ ද සිට ම මට කිසි ම ලාභ ප්‍රයෝජනයක් නැති වුණත් ඔබ සියලු දෙන ම උදෙන් ම අවදි කරන්නේ මම. ඔබ ගේ කම්මැළිකම් දුරු කරන්නේ මම. මා ඒ අතින් ලොකු සේවයක් ඔබට කරනවා. වෙන කවුරුත් වත් එහෙම සේවයක් ඔබට කරනවා ද? මා ඔබේ රජකමට පත් කරන්න."



හත් වැන්නා වූයේ සිංහයෙකි. "දැක්කා නේ ද? රජ වෙන්න ආපු කට්ටිය. කවර දත් කො තැනෙක හෝ කැලෑවෙක රජ කෙනකු සිටියා නම් ඒ සිංහයෙක්. මුලින් කරුණු දැක්වූ අයට කැලෑවල රජකම් කරලා පුරුද්දක් තියනවා ද? එහෙම වුවහොත් මුළු කැලෑව ම දවස් දෙක තුනෙකින් විනාශවෙලා යාවි. හැම කැලෑවෙක ම සිද්ධ වුණා වාගේ මේ කැලෑවෙත් රජකම මට පවරන්න."

තව කවුරුත් හරි ඉන්නවා ද කරුණු ඉදිරිපත් කරන්න. කැලෑ සංගමයේ සභාපති අසා ටික මොහොතකට පසු, ඉදිරියට ආ කළු කුහුඹියකු,

"ඔබ මා දැක්කා ම මට විහිළු කරන්නත් පුළුවන්. එහෙත් මීට ඉහත පැමිණි කවුරුන් වත් ඔවුන් ගේ පුරාජේ රුව පැවසුවා මිස අනාගතය කරදරයක් නැති ව වාසය කරන්න සැලැසුම් ඉදිරිපත් කළේ නෑ නේ ද?





මා කියනවා අපේ වර්ගයේ සියලු දෙනා වාගේ ම මාත් ජීවිතය හොඳට සැලැසුම් කොට තමයි ජීවත් වන්නේ. අද කෑවා ම හෙට කෑම ගැනත් හිතනවා. හොඳ කලක්, හොඳ දේශගුණයක් තිබෙන විට නරක කලක් නරක දේශගුණයක් ගැන සිතා කටයුතු කරනවා. කෑම හිඟ කාලයක් පැමිණි විට ප්‍රයෝජනය ගන්න කෑම-බීම ඉතිරි කරගන්නවා. ඒ ආකාරයට තමයි සැවො ම සැලැසුම් සාදගත යුත්තේ. අද කාලා හෙට මැරෙන්න නො වෙයි. මට පුළුවන් ඔබ සැමට හොඳ අනාගතයක් සැලැසුම් කරන්න, යෝජනා කරන්න, මට රජකම ලැබුණොත්.''

අපේක්ෂක සියල්ලන් ගේ ම අදහස් විමසූ කැලෑ සංගමය අවසානයේ දී අන්තිමට කරුණු ඉදිරිපත් කළ කළු කුහුඹුවා තම රජ විය යුතු යැයි තීරණය කළේ ය.